# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2443/33 - 2025 ජූලි මස 01 වැනි අඟහරුවාදා - 2025.07.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : KDS/HAR/4/2/1/60.
*කෘෂිකර්ම පශුසම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/18/2021/WS/423.

මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ උඩුවාවල සේවා ජලාශයේ පැති බැම්ම ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :-

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ අංක 417 උඩුවාවල බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උඩුවාවල ගමේ පිහිටි මහනුවර දිස්ත්‍රික් ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන පිළියෙළ කරන ලද අංක 320320 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 02 හි පත්‍ර අංක 12 හි ඉ.වි.ලැ 1 හි කැබලි අංක 3, 4 ලෙස දැක්වෙන පහත විස්තර සඳහන් ඉඩම් කොටස්වලට මායිම් :

01. **කැබලි අංකය 03**
ඉඩමේ නම: ගලහිටියාවේ වත්ත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා : කටුගස්තොට, උඩුවාවල, අංක 19/1 හි පදිංචි සංජීව අමරනාත් මනම්පේරි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0005.

*උතුරට* : කැබලි අංක 1, 2 සහ 5; *නැගෙනහිරට* : කැබලි අංක 5 සහ 4; *දකුණට* : පත්‍ර 1හි කැබලි අංක 76; *බටහිරට* : කැබලි අංක 1.

02. **කැබලි අංකය 04**
ඉඩමේ නම: ගලහිටියාවේවත්ත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා : කටුගස්තොට, උඩුවාවල, අංක 23/3 හි පදිංචි ඉහළ වත්තේ ගෙදර ලීලාවතී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0028.

*උතුරට* : කැබලි අංක 2, 5 සහ 6; *නැගෙනහිරට* : කැබලි අංක 6; *දකුණට* : පත්‍ර 1හි කැබලි අංක 75 සහ 76; *බටහිරට* : පත්‍ර 1 හි කැබලි අංක 76, මෙම පිඹුරේ කැබලි අංක 3 සහ 2.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2025 සැප්තැම්බර් මස 01 වැනි දින පෙ.ව. 10.00** ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, **2025 අගෝස්තු මස 20 වැනි** දිනට මත්තෙන්, ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**මොහාන් ධර්මදාස,**
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව.

2025 ජුනි මස 26 වැනි දින,
නුගවෙල, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0008

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KDS/HAR/4/2/1/53.
*කෘෂිකර්ම පශුසම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ*
*යොමු අංකය* : 4-3/12/2018/WS/291.

කුණ්ඩසාලේ-හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ යෝජිත තුළමුව ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ අංක 421 වෛගිරිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වෛගිරිය ගමේ පිහිටි මහනුවර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් මැන පිළියෙළ කරන ලද අංක 320460 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 03 හි පත්‍ර අංක 7 හි ඉ.වි.ලැ 1 හි කැබලි අංක 1 ලෙස දැක්වෙන පහත විස්තර සඳහන් ඉඩම් කොටස්වලට මායිම් :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: ලූලැලිවෙලේකුඹුර; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා : විහාරාධිපති, ලියන්ගස්තැන්න රජමහා විහාරය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4111.

*උතුරට* : පත්‍ර 1 හි කැබලි අංක 36; *නැගෙනහිරට* : පත්‍ර 1 හි කැබලි අංක 36 සහ මු.පි. මහ 5380 හි කැබලි අංක 2; *දකුණට* : මු.පි. මහ 5380 හි කැබලි අංක 2 සහ පත්‍ර අංක 1හි කැබලි අංක 112; *බටහිරට* : පත්‍ර 1 හි කැබලි අංක 112 සහ 208.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2025 සැප්තැම්බර් මස 08 වැනි දින පෙ.ව. 10.00** ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, **2025 අගෝස්තු මස 27** වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**මොහාන් ධර්මදාස,**
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව.

2025 ජුනි මස 26 වැනි දින,
නුගවෙල, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0009

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.